දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය',ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
" Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

පෞද්ගලික පාසල්

මගේ අංකය / எமது இல. / My No: ED/01/10/01/28/152

ඔබේ අංකය / உமது இல. / Your No: ....

දිනය / திகதி / Date: 2017. 05. 23

චක්‍රලේඛ අංක :19/2017

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල් කළමණාකරුවන්,
ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල් විදුහල්පතිවරුන්,

ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ගුරුවරුන් සඳහා 2017 අයවැය තුළින් යෝජිත අග්‍රහාර රක්ෂණ ක්‍රමයේ වරප්‍රසාද ලබා දීම.

රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අධ්‍යාපනය වැඩි දියුණු කිරීම අරමුණු කරගෙන රජයේ සේවකයින් විසින් භුක්ති විඳිනු ලබන අග්‍රහාර රක්ෂණ වරප්‍රසාදය රජයේ අනුමත පෞද්ගලික පාසල් ගුරුවරුන් දිරිගැන්වීම සඳහා ද ලබාදීමට 2017 අයවැය යෝජනා මඟින් තීරණය කර ඇත.

02. අග්‍රහාර රක්ෂණ ක්‍රමයේ වරප්‍රසාද හිමිගැන්වීම පිළිබඳ උපදෙස් ලබාදීම මෙම චක්‍රලේඛයෙන් අපේක්ෂා කෙරේ.

03. අග්‍රහාර සාමාන්‍ය යෝජනා ක්‍රමය, අග්‍රහාර රිදී යෝජනා ක්‍රමය හා අග්‍රහාර රන් යෝජනා ක්‍රමය වශයෙන් ක්‍රියාත්මක වන මෙම රක්ෂණ යෝජනා ක්‍රමය පහත අංග 2 කින් සමන්විත වේ.

I. වෛද්‍ය රක්ෂණාවරණය

II. පෞද්ගලික හදිසි අනතුරු සහ ස්වාභාවික මරණ රක්ෂණාවරණය

04. සුදුසුකම්

4.1) මෙම වරප්‍රසාදය සඳහා රජයේ අනුමත, පෞද්ගලික පාසල්වල අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අනුමත ගුරුවරයෙකු වශයෙන් විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් ලබාගෙන රජයෙන් වැටුප් ආධාර ලබන ගුරුවරුන් පමණක් සුදුසුකම් ලබයි. වැටුප් ආධාර නොලබන රජයේ අනුමත පෞද්ගලික පාසල්වල, අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් සුදුසුකම් නොලබන හෙයින් මෙම වරප්‍රසාදය හිමි නොවන බව සැලකිය යුතුය.

4.2) 2017 ජුනි මස සිට මෙම රක්ෂණ ක්‍රමය සඳහා අනිවාර්යෙන් දායක කර ගනු ලැබුවද, අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ ලියාපදිංචි වීම සඳහා ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කර ඇති අයදුම්පත, සියලුම ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් විසින් සම්පූර්ණ කර, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් ජාතික රක්ෂණභාර අරමුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

4.3) රජයේ අනුමත නව පත්වීම් ලබන ගුරුවරුන් විසින් ද රජයේ අනුමත පත්වීමට අනුව රාජකාරියට වාර්තා කිරීමේ ලිපියේ/වැඩ භාර ගැනීමේ ලිපියේ පිටපතක් සමග අග්‍රහාර රක්ෂණ ක්‍රමයට දායක වීමේ අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් ජාතික රක්ෂණභාර අරමුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

05. සාමාජිකත්වය ලැබීම

5.1) ඉහත 4.1 ඡේදයේ සඳහන් කර ඇති සියලුම ගුරුවරුන් අග්‍රහාර සාමාන්‍ය රක්ෂණ ක්‍රමය සඳහා දායක වීම අනිවාර්ය වන අතර, රජයෙන් ලබා දෙන වැටුප් දීමනාවෙන් මුදල් අයකර ගනු ලබන මාසයේ සිට ඔවුන්ට සාමාජිකත්වය හිමි වේ. මූලික අවශ්‍යතා සපුරා ඇති, අග්‍රහාර රිදී/ රන් යෝජනා ක්‍රම සඳහා මනාපය පළ කරන ගුරුවරුන්, එම රක්ෂණ යෝජනා ක්‍රම සඳහා දායක කර ගනු ලැබේ.

5.2) අග්‍රහාර රිදී යෝජනා ක්‍රමයට හා රන් යෝජනා ක්‍රමයට දායකවීම ස්වකැමැත්ත මත සිදු කළ යුතු අතර, 2017 ජුනි 10 වන දිනට පෙර මෙම රක්ෂණ යෝජනා ක්‍රම සඳහා සාමාජිකත්වය ඉල්ලුම් කරන, දැනට අනුමත පත්වීම්ධාරීන් වශයෙන් පත්වීම් ලබා ඇති ගුරුවරුන් සඳහා පළමු රක්ෂණ වාරිකය අය වූ දිනෙන් පසුව එළඹෙන දින සිට රිදී හා රන් යෝජනා ක්‍රමවලට අදාළ ප්‍රතිලාභ හිමිකම ලැබේ.

5.3) 2017 ජුනි 10 වන දිනෙන් පසුව රිදී හෝ රන් යෝජනා ක්‍රමවලට සාමාජිකත්වය ඉල්ලුම් කරන දැනට අනුමත පත්වීම්ධාරීන් වශයෙන් පත්වීම් ලබා ඇති ගුරුවරුන් සඳහා පළමු වාරික 03 අයවීමෙන් පසුව ඇතිවන, ප්‍රතිලාභ ලබා දිය හැකි සිදුවීම් සඳහා රිදී හා රන් යෝජනා ක්‍රමවලට අදාළ ප්‍රතිලාභ හිමිවන අතර, පළමු වාරික තුනට අදාළ තෙමස් කාල සීමාව තුළදී අග්‍රහාර සාමාන්‍ය රක්ෂණ ක්‍රමයට අදාළ ප්‍රතිලාභ හිමි වේ.

5.4) තම මුල් පත්වීමේදීම රිදී හෝ රන් රක්ෂණ යෝජනා ක්‍රම සඳහා මනාපය පළ කරන ගුරුවරයෙකුට සිය පළමු වාරිකය අය වූ දින සිටම එම යෝජනා ක්‍රමවලට අදාළ ප්‍රතිලාභ හිමිකම ලැබේ.

5.5) ඉහළ දායකත්ව මුදලක් සහිත ප්‍රතිලාභ ක්‍රමයක් (රිදී/ රන්) සඳහා ස්වකීය කැමැත්ත ප්‍රකාශ කිරීමෙන් පසු, දායකයා විශ්‍රාම ගන්නා තෙක් නැවත එය අඩු දායකත්ව මුදලක්

සහිත ප්‍රතිලාභ ක්‍රමයකට වෙනස් කළ නොහැක. අවශ්‍ය වන්නේ නම් රිදී යෝජනා ක්‍රමයට මනාපය ප්‍රකාශ කළ දායකයෙකුට පසුව රන් යෝජනා ක්‍රමයට දායක වීමට ස්වකීය මනාපය වෙනස් කිරීමට පමණක් ඉඩදිය හැකිය.

5.6) සාමාන්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයට දායක වී ඇති ගුරුභවතුන් ස්වකීය කැමැත්ත මත, රිදී හෝ රන් රක්ෂණ යෝජනා ක්‍රමයට දායකවීම සඳහා මෙහි ඇමුණුම 02 මගින් ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රය පුරවා, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය ද සමග ජාතික රක්ෂණභාර අරමුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

06. වාරික ගෙවීම

6.1) ඉහත 4.1 ඡේදයේ සඳහන් කර ඇති ගුරුවරුන් අග්‍රහාර සාමාන්‍ය රක්ෂණ ක්‍රමය සඳහා දායක වීම අනිවාර්ය වන හෙයින් අග්‍රහාර සාමාන්‍ය යෝජනා ක්‍රමය සඳහා එම ගුරුවරුන්ගේ මාසික වැටුපෙන් රු. 125/- ක් බැගින් වූ මාසික වාරික මුදලක් ද, අග්‍රහාර රිදී යෝජනා ක්‍රමය සඳහා දායක වන ගුරුවරුන්ගේ මාසික වැටුපෙන් රු. 300/- ක් බැගින් වූ මාසික වාරික මුදලක් ද, අග්‍රහාර රන් යෝජනා ක්‍රමය සඳහා දායක වන ගුරුවරුන්ගේ මාසික වැටුපෙන් රු. 600/- ක් බැගින් වූ මාසික වාරික මුදලක් ද අය කර ගනු ලබන අතර, එම මුදල් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ජාතික රක්ෂණභාර අරමුදල් මණ්ඩලය වෙත යැවිය යුතු වේ.

6.2) ඒ ඒ කලාප අධ්‍යාපන කාර්යාලවලින් මාසිකව ජාතික රක්ෂණභාර අරමුදල වෙත යවන ලද වාරික මුදල් ප්‍රමාණය හා සාමාජික සංඛ්‍යාව පිළිබඳව වූ වාර්තාවක් මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතුය.

6.3) සාමාජික රක්ෂණ වාරික මුදල් අයකරන දිනය, සෑම මසකම 20 වන දින ලෙස සැලකිය යුතු වේ.

07. ප්‍රතිලාභ

7.1) අග්‍රහාර සාමාන්‍ය යෝජනා ක්‍රමයට අදාළ ප්‍රතිලාභ ඇමුණුම 03 මගින් ද, අග්‍රහාර රිදී යෝජනා ක්‍රමයට අදාළ ප්‍රතිලාභ ඇමුණුම 04 මගින් ද, අග්‍රහාර රන් යෝජනා ක්‍රමයට අදාළ ප්‍රතිලාභ ඇමුණුම 05 මගින් ද දැක් වේ.

7.2) අදාළ ගුරුභවතා සේවයෙන් පහ කිරීම, විදේශ නිවාඩු ලබා ගැනීම (රාජකාරී විදේශ නිවාඩු හැර), වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම, සේවයෙන් ඉවත් වීම, සේවය අතහැර යාම යන අවස්ථාවලදී හා නීති විරෝධී ක්‍රියාවක නිරතවීම හේතුවෙන් සිදුවන හදිසි අනතුරු සඳහා මෙම රකෂණ ක්‍රමයේ ප්‍රතිලාභ සඳහා හිමිකම නොලැබේ.

7.3) රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අනුමත පත්වීම්ලාභී ගුරුවරුන් සඳහා ස්ථාන මාරු ක්‍රමයක් ක්‍රියාත්මක නොවන බැවින් තමා සේවය කරමින් සිටින පෞද්ගලික පාසලෙන් විධිමත් පරිදි සේවයෙන් ඉවත් වී වෙනත් අනුමත පෞද්ගලික පාසලකට විධිමත් පරිදි පත්කිරීම සිදුවන අවස්ථාවලදී සේවා ඛණ්ඩනයක් පවතී නම්, එම කාල සීමාව අතහැර අග්‍රහාර රක්ෂණ දායක මුදල් අයකර යැවීමට කටයුතු කළ යුතු වේ. එම කාල සීමාව තුළ රක්ෂණ ආවරණය ද හිමි නොවේ.

7.4) විශ්‍රාම යාමේ වයස එළඹීමට පෙර විධිමත් පරිදි සේවයෙන් ඉවත් වී යළි පාසලකට පත්වීමක් අනුමත කර නොගෙන සිටින අවස්ථාවලදී අග්‍රහාර රක්ෂණාවරය සඳහා හිමිකම නොලැබේ.

7.5) තවද රජයේ අනුමත ආධාර ලබන පෞද්ගලික පාසලකින් විධිමත් පරිදි සේවයෙන් ඉවත් වී රජයේ අනුමත ආධාර නොලබන පෞද්ගලික පාසලක පත්වීමක් අනුමත කරගන්නා අවස්ථාවලදී අග්‍රහාර රක්ෂණාවරය සඳහා හිමිකම නොලැබේ.

08. අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබා ගැනීම

8.1) අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා රෝහල් ගතවීමකදී හෝ හදිසි අනතුරක් සිදු වූ විටක දී හෝ ස්වාභාවික මරණයක් සිදු වූ විටකදී දින 14 ක් ඇතුළත ඒ බැව් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත දැන්විය යුතුය. අදාළ සියලු ම වෛද්‍ය ශාස්ත්‍ර හා රෝහල් බිල්පත්වල මුල් පිටපත් ප්‍රතිලාභ ලබාගැනීමේ ඉල්ලුම්පතට (ඇමුණුම 06) අමුණා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් දින 90 ක් ඇතුළත ජාතික රක්ෂණාභාර අරමුදල් මණ්ඩලය වෙත පහත සඳහන් ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

කළමනාකරු,
ජාතික රක්ෂණාභාර අරමුදල් මණ්ඩලය,
අංක 97, මරදාන පාර,
කොළඹ 10.

8.2) ඇස් කණ්ණාඩි සඳහා රක්ෂණ හිමිකම ලබාගැනීමේදී වෛද්‍යවරයා හමුවීම සඳහා මුදල් ගෙවූ ලදුපත (චැනල් රිසිට්පත), වෛද්‍ය නිර්දේශය සහ ඇස් කණ්ණාඩි මිලදී ගත් ලදුපත (මුදල් භාරගත් බවට රබර් මුද්‍රා සහිත) යන ලියකියවිලි මුල් පිටපත් ජාතික රක්ෂණාභාර අරමුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

8.3) නේවාසික ප්‍රතිකාර සඳහා රක්ෂණ ප්‍රතිලාභ හිමිකම් ලබාගැනීමේ දී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කළ රෝග විනිශ්චය පත්‍රිකාවේ පිටපත, සියලුම ලදුපත්වල මුල් පිටපත් (මුදල් භාරගත් බවට රබර් මුද්‍රා සහිතව), නේවාසික කාලය තුළ රෝහලින් බැහැරව ලබාගත් ඖෂධ සහ සිදු කරන ලද පරීක්ෂණ සඳහා වෛද්‍ය නිර්දේශවල මුල් පිටපත් සහ ලදුපතේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය.

09. ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීම

9.1) යම් කිසි සාමාජික නිලධාරියෙකු ව්‍යාජ බිල්පත් හෝ වෛද්‍ය සහතික ඉදිරිපත් කොට ඇත්නම් ජාතික රක්ෂණාභාර අරමුදල් මණ්ඩලය විසින් ඒ බැව් අධ්‍යාපන ලේකම් වෙත වාර්තා කිරීමට කටයුතු කරනු ඇත.

9.2) එම වාර්තා අනුව සාමාජිකයාට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට අධ්‍යාපන ලේකම් විසින් පියවර ගනු ලැබේ.

9.3) ගුරුවරයා වැරදිකරුවකු වුවහොත්, පවතින නීති විධිවිධාන අනුව කටයුතු කරනු ලැබේ.

11. මෙම චක්‍රලේඛය මුදල් අමාත්‍යාංශය හා ජාතික රක්ෂණභාර අරමුදල් මණ්ඩලයේ එකඟත්වය මත නිකුත් කරනු ලබන අතර, ඊට අදාළ විධිවිධාන 2017.05.25 දින සිට ක්‍රියාත්මක කෙරේ.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:

1. ලේකම්	-	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය
2. ලේකම්	-	මුදල් අමාත්‍යාංශය
3. ලේකම්	-	ජාතික ප්‍රතිපත්ති, සැලසුම් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
4 අධ්‍යක්ෂ ජනරාල්	-	ජාතික අයවැය දෙපාර්තමේන්තුව
5. සභාපති	-	ජාතික රක්ෂණභාර අරමුදල
6. ප්‍රධාන මූල්‍ය නිලධාරී	-	අධ්‍යාපන අමාත්‍යාංශය

ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් අග්‍රහාර රක්ෂණ ක්‍රමයට බඳවා ගැනීමේ අයදුම්පත.

සාමාජිකයින් විසින් සම්පූර්ණ කළ යුතු මෙම ඉල්ලුම් පත්‍රය පරිගණකගත කිරීමේ පහසුව සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත්‍රය තේරුම් ගැනීමේ පහසුව සඳහා එහි සිංහල හා දෙමළ භාෂා පරිවර්ථනය මෙහි දක්වා ඇත.

ඔප්පු අංකය :

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

Photo

- ***සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. හිස්ව තැබීම හා කඩඉරි තැබීම නොකළ යුතුය.***

01. වාසගම සමග සම්පූර්ණ නම : ....

....

1.2. පෞද්ගලික ලිපිනය :

....

....

1.3. උපන් දිනය : .... වයස : ....

1.4. ජාතික හැඳුනුම්පත් අංකය : ....

1.5. වර්තමාන තනතුර :.. පත්වීම් දිනය :....................................

1.6. දායකයාගේ දුරකථන අංකය : ජංගම .... නිවස ....

කාර්යාලය ....

1.7. ඊමේල් ලිපිනය ....

02. සේවයේ යෙදී සිටින ආධාර ලබන රජයේ අනුමත පාසලේ නම : ....

....

2.1. පාසලේ ලිපිනය :...

....

03. ඉල්ලුම් කරන අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න)

සාමාන්‍ය යෝජනා ක්‍රමය ☐ රිදී යෝජනා ක්‍රමය ☐ රන් යෝජනා ක්‍රමය ☐

3.3. බැංකුවේ නම සහ ශාඛාව :..

ගිණුම් අංකය :..

04. සිවිල් තත්වය : විවාහක / අවිවාහක ....

4.1. විවාහක නම්, කලත්‍රයාගේ නම :..

උපන් දිනය :..

වයස :..

4.2. කලත්‍රයා රැකියාවක් කරන්නේ නම්, එම ආයතනයේ නම : ....

....

4.3. අවිවාහක රැකියාවක් නොකරන දරුවන්ගේ නම් (වයස අවු. 21 ට අඩු)

නම	උපන් දිනය	වයස
1..	....	....
2..	....	....
3..	....	....
4..	....	....
5..	....	....

05. සාමාජිකයා අවිවාහක නම් දෙමව්පියන්ගේ විස්තර (වයස අවු. 70 ට අඩු නම් පමණක් සඳහන් කරන්න.)

I. පියාගේ නම : ....

ජා. හැ. අංකය : ....

උපන් දිනය : ....

වයස :..

II. මවගේ නම : ....

ජා. හැ. අංකය : ....

උපන් දිනය : ....

වයස :..

III. මව හා / හෝ පියා ඔබගෙන් යැපෙන්නේද ? එසෙ නම් කවදා සිටද :

06. ඔබ සහ ඔබේ යැපෙන්නන් හොඳ සෞඛ්‍ය තත්වයෙන් පසුවෙනවාද ? එසෙ නොමැති නම් විස්තර කරන්න. :

ඉහත සඳහන් තොරතුරු නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි.

....

සාමාජිකයාගේ අත්සන

....

ආයතන ප්‍රධානියගේ අත්සන (නිල මුද්‍රාව)

දිනය :..

ඇමුණුම 02

<u>ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අනුමත පත්වීම්ධාරී ගුරුවරුන්ගේ අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය සංශෝධනය කිරීමේ අයදුම්පත.</u>

(ඉහළ දායකත්ව මුදලක් සහිත යෝජනා ක්‍රමයකින් (රිදී/රන්) අඩු දායකත්ව මුදලක් සහිත යෝජනා ක්‍රමයකට වෙනස් කළ නොහැක)

1. වාසගම සමග සම්පූර්ණ නම : ....

   ....

2. පෞද්ගලික ලිපිනය : ....

   ....

3. උපන් දිනය : .... වයස : ....

4. ජාතික හැඳුනුම්පත් අංකය : ....

5. වර්තමාන තනතුර :... පත්වීම් දිනය :..................................

6. දායකයාගේ දුරකථන අංකය : ජංගම .... නිවස ....

   කාර්යාලය ....

7. ඊමේල් ලිපිනය :..

8. රජයේ අනුමත ආධාර ලබන පෞද්ගලික පාසලේ නම :

....

9. පාසලේ ලිපිනය :..

....

10. වර්තමාන අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න)

සාමාන්‍ය ☐ රිදී ☐

11. දායකත්වය දැරීමට කැමති නව රක්ෂණ යෝජනා ක්‍රමය (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න)

රිදී ☐ රන් ☐

12. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය : නිර්දේශ කරමි/ නොකරමි

නම : ....

තනතුරු: ....

අත්සන : ....

(නිල මුද්‍රාව යොදන්න)

ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් සඳහා ලබා දෙන ප්‍රතිලාභ - අග්‍රහාර "සාමාන්‍ය" රක්ෂණ යෝජනා ක්‍රමය

I කොටස - වෛද්‍ය රක්ෂණාවරණය.

	ප්‍රතිලාභ වර්ගය	සීමාව
01.	රෝහල් සහ සාත්තු නිවාස ගාස්තු	රු. 30,000.00 (දිනකට කාමර ගාස්තුව රු 3000/- බැගින්)
02.	උපදේශක විශෙෂඥ වෛද්‍යවරුන්ගේ නිර්දේශ මත ලබා දෙන විශෙෂ ප්‍රතිකාර හා හෙද සෙවා සඳහා සහ රෝහල්, සාත්තු නිවාසයන්හි විශෙෂඥ ප්‍රතිකාර සඳහා වැය වන වෛද්‍ය සහ ශල්‍යකර්ම සඳහා ශල්‍ය හා නිර්වින්දන වෛද්‍යවරුන්ගේ ගාස්තු	රු. 50,000.00 (පවුල් ඒකකයක් සඳහා)
03.	පිළිගත් වෛද්‍යවරයෙකුගේ හෝ වෛද්‍ය සෙවා ආඥා පනතේ 41 යටත් ලියාපදිංචි කළ වෛද්‍යවරයෙකුගේ නිර්දේශය මත ආරෝග්‍ය ශාලාවක හෝ සාත්තු නිවාසයක නේවාසික ප්‍රතිකාර ලබා ගැනීමේදී වෛද්‍ය උපදේශන සෙවා හෝ විශෙෂඥ වෛද්‍ය සෙවා සඳහා ගාස්තු	රු. 20,000.00 (පවුල් ඒකකයක් සඳහා)
04.	සූක්ෂම චිකිත්සා ප්‍රතිකාර, එක්ස් කිරණ රශ්මි හා රේඩියම් පරීක්ෂණ හා ප්‍රතිකාර, විදුලිමය ප්‍රතිකාර, කායික චිකිත්සා ඇතුළත් විශෙෂඥ සෙවා ගාස්තු.	රු. 20,000.00 (පවුල් ඒකකයක් සඳහා)
05.	ඉහත 01 සිට 04 දක්වා ප්‍රතිලාභ හිමි පුද්ගලයෙකුගේ හදිසි රෝගාබාධයකදී ජීවිතය බේරා ගැනීම සඳහා පදිංචි ස්ථානයේ සිට ළඟම ආරෝග්‍ය ශාලාවට හෝ සාත්තු නිවාසයට ගෙනයාමට සිදු වුවහොත් ගමන් ගාස්තු	රු. 1,500.00 (පවුල් ඒකකයක් සඳහා)
06.	ඉහත 01 සිට 05 දක්වා සිද්ධීන් වෙනුවෙන් (අ) එක් සිද්ධියක් සඳහා උපරිමය (ආ) එක් වර්ෂයක් සඳහා උපරිමය	 රු. 120,000.00 රු. 150,000.00 (කලත්‍රයා ද රාජ්‍ය සෙවයේ හෝ ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසලක අනුමත පත්වීම්ධාරියෙකු නම් දෙදෙනාටම රු. 300,000.00 ක ප්‍රතිලාභ හිමි වේ.
07.	සාමාජිකයින් සඳහා පමණක් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි අක්ෂි පිළිබඳ විශෙෂඥ වෛද්‍යවරයෙකුගේ නිර්දේශය මත වසර තුනකට වරක් ඇස් කණ්ණාඩි ලබා ගැනීම.	රු. 3,500.00

08.	රජයේ රෝහලක හෝ ආයුර්වේද රෝහලක වාට්ටුවක නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නේ නම් සාමාජිකයා ඇතුළු පවුල් ඒකකය වෙනුවෙන්	රු. 5,000.00 (දිනකට රු. 500/- බැගින්)
09.	I. සාමාන්‍ය දරු උපතකදී හෝ ස්වාභාවික ගබ්සාවීමක දී පෞද්ගලික රෝහලක නේවාසිකව සිටින්නේ නම් ජීවිත කාලයටම දෙවරක් (උපරිම) II. සාමාන්‍ය දරු උපතක දී හෝ ස්වාභාවික ගබ්සාවීමක දී රජයේ රෝහලක නේවාසිකව සිටින්නේ නම් ජීවිත කාලයටම දෙවරක් (උපරිම) III. සිසේරියන් දරු උපතක් සම්බන්ධව පෞද්ගලික රෝහලකට ඇතුළත් කර තිබේ නම් - ජීවිත කාලය තුළ උපරිමය අවස්ථා දෙකකට යටත්ව	දිනකට රු. 2,000/- බැගින් දින 5 ක උපරිමයක් සඳහා. දිනකට රු. 500/- බැගින් දින 5 ක උපරිමයක් සඳහා රු. 40,000.00
10.	I. සාමාජිකයින් සඳහා පමණක් පහත සඳහන් හෘදය ආශ්‍රිත ශල්‍යකර්ම වෙනුවෙන් ප්‍රතිපූර්ණය කිරීම (උපරිමය) 1. Heart Attack – (Myocardial Refraction) 2. Coronary Artery Disease (Coronary by – Pass Surgery) 3. Stroke (Cerebra Vascular accident) 4. Double (Mitral & Aortic) Value Replacement 5. Atrial Septal Defect 6. Percutancous Transluminial Cororany Angioplast (PTC) 7. Fallot Tetrology 8. Bruganda Syndrome 9. Implanting Pacemaker – Single 10. Implanting Pacemaker – Double 11. Mitral valve Replacement II. RF Ablation - සාමාජිකයින් සඳහා පමණයි (උපරිම) III. (අ) සාමාජිකයින් සඳහා පමණක් පහත සඳහන් ශල්‍යකර්ම සඳහා 1. Cancer 2. Kidney Transplant	රු.500,000.00 රු. 225,000.00 රු. 200,000.00

	(ආ) සාමාජිකයන් සඳහා පමණක් පහත සඳහන් ශල්‍යකර්ම සඳහා 1. Renal Failure 2. Major Organ Transplant, such as lung or born marrow, However this benefit will not be paid to a donor of a major organ 3. Paralysis 4. Multiple Sclerosis 5. Primary Pulmonary Arterial Hypertension 6. Fulminate Hepatitis IV. හෘදය පිළිබඳ ශල්‍යකර්ම වියදම් ප්‍රතිපූර්ණය කිරීම - පවුල් ඒකකයක් සඳහා	රු. 150,000.00 රු. 100,000.00
11.	ශ්‍රවණ ආධාර - පවුල් ඒකකයක් සඳහා	රු. 50,000.00

<u>පවුල් ඒකකය</u>

විවාහක සාමාජිකයින් :- සාමාජිකයා, කලත්‍රයා සහ රැකියා විරහිත අවිවාහක හා යැපෙන අවුරුදු 21 ට අඩු දරුවන් සහ අවුරුදු 21 ඉක්ම වූවද මුළුමනින්ම ආබාධිත වූ අවිවාහක හා සෙවා වියුක්ත ළමුන්.

- අවුරුදු 21 ට වැඩි, මුළුමනින්ම ආබාධිත තත්වයට පත් , අවිවාහක, සෙවා වියුක්ත දරුවන් සඳහා රෝහල් හා වෛද්‍ය ගාස්තු අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ හිමිකම් ප්‍රතිපූර්ණය කිරීමට අදාළව එම දරුවාගේ ආසන්නම රෝගී කාල සීමාවට අදාළ වෛද්‍ය වාර්තා , රෝග නිශ්වය කාඩ්පත් ආයතන ප්‍රධානියා විසින් සහතික කළ යුතු අතර, එම දරුවා අවුරුදු 21 ට වැඩි බවත්, මුළුමනින්ම ආබාධිත, අවිවාහක හා සෙවා වියුක්ත බවත් සහතික කළ යුතු වේ. එසෙම එම දරුවා සම්බන්ධයෙන් ඉහත තොරතුරු සත්‍ය බවට අදාළ ග්‍රාම නිලධාරී වෙතින් ලබා ගත් සහතිකයක්, ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ලබාදිය යුතුය.

අවිවාහක සාමාජිකයින් :- සාමාජිකයා සහ වයස අවු. 70 ට අඩු ගුරුභවතාගේ දෙමව්පියන්

<u>II කොටස</u>

<u>පෞද්ගලික හදිසි අනතුරු සහ ස්වාභාවික මරණ රක්ෂණාවරණය.</u>

ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල්වල, අනුමත පත්වීම්ධාරී රජයෙන් වැටුප් ආධාර ලබන, විශ්‍රාම වැටුප් සහිත සියලුම සාමාජිකයින් පැය 24 පුරාම මෙම රක්ෂණ ක්‍රමයෙන් ආවරණය වේ.

01. ලැබෙන ප්‍රතිලාභ

I.	රක්ෂණාවරණය	-	දවසෙ පැය 24 පුරාම
II.	උපරිම වයස් සීමාව	-	අවුරුදු 60 දක්වා
III.	රක්ෂිත මුදල	-	රු. 600,000.00 හදිසි අනතුරකින් මරණය සිදුවුවහොත් හෝ පූර්ණ අකර්මන්‍යතාවකට පත්වුවහොත් හෝ රක්ෂිත මුදල යැපෙන්නන් අතර බෙදනු ලැබේ.
IV.	ගෙවනු ලබන උපරිම මුදල	-	රු. 600,000.00

02. අකර්මණ්‍යතාවයේ ස්වාභාවය අනුව ප්‍රතිලාභ හිමිවන ආකාරය

අ. ස්ථිර අකර්මණ්‍යතාව

හදිසි අනතුර නිසා සිදුවන මරණයක දී හෝ ස්ථිර පූර්ණ අකර්මණ්‍යතාවකදී	සම්පූර්ණ රක්ෂිත මුදල

ආ. ස්ථිර අර්ධ අකර්මණ්‍යතාව

එක් පාදයක් අහිමි වීම, එක් ඇසක් අහිමි වීම එක් අතක් අහිමි වීම	රක්ෂිත මුදලින් 50% ක්

ඇ. තාවකාලික පූර්ණ අකර්මණ්‍යතාව

සති 52 ක කාලයක් සඳහා	සතියකට රු. 500/- ක් බැගින්

ඈ. තාවකාලික අර්ධ අකර්මණ්‍යතාව

සති 52 ක කාලයක් සඳහා	සතියකට රු. 300/- ක් බැගින්

ඉ. ස්වාභාවික මරණයක් සඳහා	රු. 150,000.00

ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් සඳහා ලබා දෙන ප්‍රතිලාභ - අග්‍රහාර "රිදී" රක්ෂණ යෝජනා ක්‍රමය

උපලේඛනය 01 - ශල්‍යකර්ම සහ රෝහල් වියදම් ප්‍රතිපූර්ණ රක්ෂණාවරණය.

	ප්‍රතිලාභ වර්ගය	සීමාව
01.	රෝහල් සහ සාත්තු නිවාස ගාස්තු	රු. 50,000.00 (දිනකට කාමර ගාස්තුව රු 5000/- බැගින්)
02.	උපදේශක විශෙෂඥ වෛද්‍යවරයන්ගේ නිර්දේශ්‍ය මත ලබා දෙන විශෙෂ ප්‍රතිකාර හා හෙද සෙවා සඳහා සහ රෝහල්, සාත්තු නිවාසයන්හි විශෙෂඥ ප්‍රතිකාර සඳහා වැය වන වෛද්‍ය සහ ශල්‍යකර්ම සඳහා	රු. 60,000.00 (පවුල් ඒකකයක් සඳහා)
03.	ආරෝග්‍ය ශාලාවක හෝ සාත්තු නිවාසයක නේවාසික ප්‍රතිකාර ලබා ගැනීමේදී වෛද්‍ය උපදේශන සෙවා හෝ විශෙෂඥ වෛද්‍ය සෙවා ගාස්තු හා නිර්වින්දන වෛද්‍යවරුන්ගේ ගාස්තු	රු. 35,000.00 (පවුල් ඒකකයක් සඳහා)
04.	සූක්ෂම චිකිත්සා ප්‍රතිකාර, එක්ස් කිරණ රශ්මි හා රේඩියම් පරීක්ෂණ හා ප්‍රතිකාර, විදුලිමය ප්‍රතිකාර, කායික චිකිත්තසා ඇතුළත් විශෙෂඥ සෙවා ගාස්තු.	රු. 30,000.00 (පවුල් ඒකකයක් සඳහා)
05.	ඉහත 01 සිට 04 දක්වා සිද්ධීන්ට යටත්ව පෞද්ගලික ආයූර්වේද රෝහලක නේවාසිකව වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම වෙනුවෙන් (පෞද්ගලික ආයූර්වේද රෝහල, දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශය යටතේ ලියාපදිංචිව තිබිය යුතුය.)	රු. 160,000.00 (උපරිමය)
06.	ඉහත 01 සිට 05 දක්වා සිද්ධීන් වෙනුවෙන් (අ) එක් සිද්ධියක් සඳහා උපරිමය (ආ) එක් වර්ෂයක් සඳහා උපරිමය	 රු. 160,000.00 රු. 250,000.00
07.	සාමාජිකයින් සඳහා පමණක් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි අක්ෂි පිළිබඳ විශෙෂඥ වෛද්‍යවරයෙකුගේ නිර්දේශය මත වසර තුනකට වරක් ඇස් කණ්ණාඩි ලබා ගැනීම.	රු. 3,500.00
08.	I. රජයේ රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නේ නම් සාමාජිකයා ඇතුළු පවුල් ඒකකයක් වෙනුවෙන් II. විශෙෂඥ වෛද්‍ය නිර්දේශය මත මිලදී ගන්නා ඖෂධ වියදම සඳහා (රෝහල්ගතව සිටින කාලයේදී පමණි) III. විශෙෂඥ වෛද්‍ය නිර්දේශය මතසිදු කරන වෛද්‍ය පරීක්ෂණ සඳහා (රෝහල්ගතව සිටින කාලයේදී පමණි)	රු. 10,000.00 (දිනකට රු. 1000/- බැගින්) රු. 60,000.00 රු. 30,000.00

09.	රජයේ ආයුර්වේද රෝහලක, වාට්ටුවක නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නේ නම් සාමාජිකයා ඇතුළු පවුල් ඒකකය වෙනුවෙන්	රු. 10,000.00 (දිනකට රු 1000/- බැගින්)
10.	රජයේ රෝහලක දී කෙරෙන සාමාන්‍ය දරු උපත් ආවරණය /මළ දරු උපත් ආවරණය, ගබ්සාවීම්, සිසේරියන් දරු උපත් සඳහා ලබා දෙන දීමනාව (එක් අතුළුවීමකදී උපරිම දින 05)	රු7,500.00 (දිනකට රු 1,500/- බැගින්)
11.	සාමාන්‍ය දරු උපත් ආවරණය (පෞද්ගලික රෝහලක)	රු.25,000.00
12.	පෞද්ගලික රෝහලක සිදු කරන සිසෙරියන් සැත්කමක් සඳහා (සාමාජිකයා සඳහා පමණයි)	රු. 60,000.00
13.	පවුලේ සාමාජිකයින් සඳහා හෘදය ආශ්‍රිත ශල්‍යකර්ම වෙනුවෙන්	රු. 150,000.00

උපලේඛනය 02 - ශල්‍යකර්ම සහ රෝහල් වියදම් ප්‍රතිපූර්ණ රක්ෂණාවරණය.

සාමාජිකයින් සඳහා පමණක් පහත සඳහන් බරපතල ශල්‍යකර්ම වියදම් ප්‍රතිපූර්ණය කිරීම.	සීමාව
මොළයේ ශල්‍යකර්ම	රු. 800,000.00
වකුගඩු බද්ධ කිරීම	රු. 800,000.00
හෘද සැත්කම්	
දායකයා සඳහා	රු. 800,000.00
RF Ablation (දායකයා සඳහා)	රු. 350,000.00
පිළිකා ශල්‍යකර්ම වියදම්	රු. 400,000.00
දණහිස් බද්ධ කිරීම	රු. 150,000.00
උකුල් ඇටය බද්ධ කිරීම	රු. 150,000.00
ශ්‍රවණ ආධාර	රු. 75,000.00

පවුල් ඒකකය

විවාහක සාමාජිකයින් :- සාමාජිකයා, කලත්‍රයා සහ රැකියා විරහිත අවිවාහක හා යැපෙන අවුරුදු 21 ට අඩු දරුවන් සහ අවුරුදු 21 ඉක්ම වූවද මුළුමනින්ම ආබාධිත වූ අවිවාහක හා සෙවා වියුක්ත ළමුන්.

- අවුරුදු 21 ට වැඩි, මුළුමනින්ම ආබාධිත තත්වයට පත් , අවිවාහක, සෙවා වියුක්ත දරුවන් සඳහා රෝහල් හා වෛද්‍ය ගාස්තු අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ හිමිකම් ප්‍රතිපූර්ණය කිරීමට අදාළව එම දරුවාගේ ආසන්නම රෝගී කාල සීමාවට අදාළ වෛද්‍ය වාර්තා , රෝග නිශ්චය කාඩ්පත් ආයතන ප්‍රධානියා විසින් සහතික කළ යුතු අතර, එම දරුවා අවුරුදු 21 ට වැඩි බවත්, මුළුමනින්ම ආබාධිත, අවිවාහක හා සෙවා වියුක්ත බවත් සහතික කළ යුතු වේ. එසෙම එම දරුවා සම්බන්ධයෙන් ඉහත තොරතුරු සත්‍ය බවට අදාළ ග්‍රාම නිලධාරී වෙතින් ලබා ගත් සහතිකයක්, ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ලබාදිය යුතුය.

අවිවාහක සාමාජිකයින් :- සාමාජිකයා සහ වයස අවු. 70 ට අඩු ගුරුහවතාගේ දෙමව්පියන්

උපලේඛනය 03 - පෞද්ගලික හදිසි අනතුරු රක්ෂණාවරණය

1. පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණය

   1.1 හදිසි අනතුරකින් මරණය දී පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණය යටතේ රු. 1,000,000.00 ලබා දේ.

   1.2 හදිසි අනතුරක් හේතුවෙන් පමණක් සිදුවන ස්ථිර පූර්ණ අකර්මණ්‍යතාවයකදී හෝ ස්ථිර අර්ධ අකර්මණ්‍යතාවයකදී රු. 1,000,000.00 ලබාදේ. එය පහත පරිදී වේ.

ප්‍රතිලාභ උපලේඛනය

01.	ඇස් දෙකෙහිම පෙනීම ස්ථිර හා පූර්ණ වශයෙන් අහිමි වී යාම.	100%	හදිසි අනතුර සිදු වී මාස 03 ක් ඇතුළත සිදුවන
02.	කපා ඉවත් කිරීම හේතුවෙන් අත් දෙකම හෝ පාද දෙකම හෝ එක් අතක් හෝ එක් පාදයක් පූර්ණ වශයෙන් අහිමි වීම.	100%	
03.	කපා ඉවත් කිරීම හේතුවෙන් එක් අතක් හෝ එක් පාදයක් පූර්ණ වශයෙන් අහිමි වීම සමග එක් ඇසක පෙනීම ස්ථිර හා පූර්ණ වශයෙන් අහිමි වීම.	100%	
04.	එක් ඇසක පෙනීම ස්ථිර හා පූර්ණ වශයෙන් අහිමි වීම.	50%	
05.	කපා ඉවත් කිරීම හේතුවෙන් එක් අතක් හෝ එක් පාදයක් අහිමි වීම	50%	

පහත සඳහන් අවස්ථාවල දී වන්දි ගෙවීම සිදුකරනු නොලැබේ.

1. එක් සිදුවීමක දී හදිසි අනතුරු හේතුවෙන් ඇතිවන ඉහත (01) සිට (05) දක්වා වන අනතුරේ ප්‍රතිඵල අවස්ථා අතරින් දායකයාට වඩාත් ඉහළ ප්‍රතිලාභ ලැබෙන එක් අවස්ථාවක් සඳහා පමණක් වන්දි ලබා දීම සිදු කරනු ලැබේ. එම අනතුරේ ප්‍රතිඵල අවස්ථා අතරින් කිහිපයකට දායකයා මුහුණ දී ඇති විටකදී ප්‍රතිලාභ ලබාදෙන ප්‍රතිඵල අවස්ථාවට හැර වෙනත් අනතුරේ ප්‍රතිඵලයකට හෝ පසු සිදුවීමකින් ඇතිවන ප්‍රතිඵලයකට නැවත වන්දි ගෙවීම සිදු කරනු නොලැබේ.

2. ස්වාභාවික මරණ රක්ෂණාවරණය.

මෙම රක්ෂණාවරණය මගින් ස්වාභාවික හේතුවක් මුල්කොට සිදුවන මරණ සඳහා වන්දි ලබාදෙනු ලැබේ. (මෙම රක්ෂණාවරණය, රක්ෂණ ඔප්පුවේ දිනයේ සිට දින 90 කට පසු ක්‍රියාත්මක වේ.)

   2.1 ස්වාභාවික මරණ ආවරණය - සාමාජිකයින් සඳහා පමණි - රු. 400,000.00

   2.2 වෙනත් රෝගාබාධයක් හේතුවෙන් සිදුවන ස්ථිර පූර්ණ අකර්මණ්‍යතාවයකදී හෝ ස්ථිර අර්ධ අකර්මණ්‍යතාවයකදී - රු. 100,000.00 (ජීවිත කාලයටම එක් වරක් පමණි)

ඇමුණුම 05

<u>ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් සඳහා ලබා දෙන ප්‍රතිලාභ - අග්‍රහාර "රන්" රක්ෂණ යෝජනා ක්‍රමය</u>

<u>උප ලේඛනය 01 - ශල්‍යකර්ම සහ රෝහල් වියදම් ප්‍රතිපූර්ණ රක්ෂණාවරණය</u>

	ප්‍රතිලාභ වර්ගය	සීමාව
01.	රෝහල් සහ සාත්තු නිවාස ගාස්තු	රු. 80,000.00 (දිනකට කාමර ගාස්තුව රු 8000/- බැගින්)
02.	උපදේශක විශෙෂඥ වෛද්‍යවරයන්ගේ නිර්දේශය මත ලබා දෙන විශෙෂ ප්‍රතිකාර හා හෙද සෙවා සඳහා සහ රෝහල්, සාත්තු නිවාසයන්හි විශෙෂඥ ප්‍රතිකාර සඳහා වැය වන වෛද්‍ය සහ ශල්‍යකර්ම සඳහා	රු. 80,000.00 (පවුල් ඒකකයක් සඳහා)
03.	ආරෝග්‍ය ශාලාවක හෝ සාත්තු නිවාසයක නේවාසික ප්‍රතිකාර ලබා ගැනීමේදී වෛද්‍ය උපදේශන සෙවා හෝ විශෙෂඥ වෛද්‍ය සෙවා ගාස්තු හා නිර්වින්දන වෛද්‍යවරුන්ගේ ගාස්තු	රු. 50,000.00 (පවුල් ඒකකයක් සඳහා)
04.	සූක්ෂම චිකිත්සා ප්‍රතිකාර, එක්ස් කිරණ රශ්මි හා රේඩියම් පරීක්ෂණ හා ප්‍රතිකාර, විදුලිමය ප්‍රතිකාර, කායික චිකිත්තසා ඇතුළත් විශෙෂඥ සෙවා ගාස්තු.	රු. 40,000.00 (පවුල් ඒකකයක් සඳහා)
05.	ඉහත 01 සිට 04 දක්වා සිද්ධීන්ට යටත්ව පෞද්ගලික ආයුර්වේද රෝහලක නේවාසිකව වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම වෙනුවෙන් (පෞද්ගලික ආයුර්වේද රෝහල, දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශය යටතේ ලියාපදිංචිව තිබිය යුතුය.)	රු. 200,000.00 (උපරිමය)
06.	ඉහත 01 සිට 05 දක්වා සිද්ධීන් වෙනුවෙන් (අ) එක් සිද්ධියක් සඳහා උපරිමය (ආ) එක් වර්ෂයක් සඳහා උපරිමය	 රු. 200,000.00 රු. 350,000.00
07.	සාමාජිකයින් සඳහා පමණක් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි අක්ෂි පිළිබඳ විශෙෂඥ වෛද්‍යවරයෙකුගේ නිර්දේශය මත වසර තුනකට වරක් ඇස් කණ්ණාඩි ලබා ගැනීම.	රු. 5,000.00
08.	I. රජයේ රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නේ නම් සාමාජිකයා ඇතුළු පවුල් ඒකකය වෙනුවෙන් II. විශෙෂඥ වෛද්‍ය නිර්දේශය මත මිලදී ගන්නා ඖෂධ වියදම සඳහා (රෝහල්ගතව සිටින කාලයේදී පමණි) III. විශෙෂඥ වෛද්‍ය නිර්දේශය මතසිදු කරන වෛද්‍ය පරීක්ෂණ සඳහා (රෝහල්ගතව සිටින කාලයේදී පමණි)	රු. 30,000.00 (දිනකට රු. 3000/- බැගින්) රු. 80,000.00 රු. 40,000.00

09.	රජයේ ආයුර්වේද රෝහලක, වාට්ටුවක නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නේ නම් සාමාජිකයා ඇතුළු පවුල් ඒකකය වෙනුවෙන්	රු. 30,000.00 දිනකට රු 3000/- බැගින්
10.	රජයේ රෝහලක දී කෙරෙන සාමාන්‍ය දරු උපත් ආවරණය /මල දරු උපත් ආවරණය, ගබ්සාවීම්, සිසේරියන් දරු උපත් සඳහා ලබා දෙන දීමනාව (එක් ඇතුළුවීමකදී උපරිම දින 05)	රු. 15,000.00 (දිනකට රු. 3000/- බැගින්)
11.	සාමාන්‍ය දරු උපත් ආවරණය (පෞද්ගලික රෝහලක)	රු.50,000.00
12.	පෞද්ගලික රෝහලක සිදු කරන සිසේරියන් සැත්කමක් සඳහා (සාමාජිකයා සඳහා පමණයි)	රු. 100,000.00
13.	පවුලේ සාමාජිකයින් සඳහා හෘදය ආශ්‍රිත ශල්‍යකර්ම වෙනුවෙන්	රු. 200,000.00

<u>උප ලේඛනය 02 - ශල්‍යකර්ම සහ රෝහල් වියදම් ප්‍රතිපූර්ණ රක්ෂණාවරණය.</u>

සාමාජිකයින් සඳහා පමණක් පහත සඳහන් බරපතල ශල්‍යකර්ම වියදම් ප්‍රතිපූර්ණය කිරීම.	**සීමාව**
මොළයේ ශල්‍යකර්ම	රු. 1,200,000.00
වකුගඩු බද්ධ කිරීම	රු. 1,200,000.00
හෘද සැත්කම් දායකයා සඳහා RF Ablation (දායකයා සඳහා)	 රු. 1,000,000.00 රු. 500,000.00
පිළිකා ශල්‍යකර්ම වියදම්	රු. 600,000.00
දණහිස් බද්ධ කිරීම	රු. 250,000.00
උකුල් ඇටය බද්ධ කිරීම	රු. 250,000.00
ශ්‍රවණ ආධාර	රු. 100,000.00

<u>පවුල් ඒකකය</u>

විවාහක සාමාජිකයින් :- සාමාජිකයා, කලත්‍රයා සහ රැකියා විරහිත අවිවාහක හා යැපෙන අවුරුදු 21 ට අඩු දරුවන් සහ අවුරුදු 21 ඉක්ම වූවද මුළුමනින්ම ආබාධිත වූ අවිවාහක හා සෙවා වියුක්ත ළමුන්.

- අවුරුදු 21 ට වැඩි, මුළුමනින්ම ආබාධිත තත්වයට පත් , අවිවාහක, සෙවා වියුක්ත දරුවන් සඳහා රෝහල් හා වෛද්‍ය ගාස්තු අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ හිමිකම් ප්‍රතිපූර්ණය කිරීමට අදාළව එම දරුවාගේ ආසන්නම රෝගී කාල සීමාවට අදාළ වෛද්‍ය වාර්තා , රෝග නිශ්චය කාඩ්පත් ආයතන ප්‍රධානියා විසින් සහතික කළ යුතු අතර, එම දරුවා අවුරුදු 21 ට වැඩි බවත්, මුළුමනින්ම ආබාධිත, අවිවාහක හා සෙවා වියුක්ත බවත් සහතික කළ යුතු වේ. එසෙම එම දරුවා සම්බන්ධයෙන් ඉහත තොරතුරු සත්‍ය බවට අදාළ ග්‍රාම නිලධාරී වෙතින් ලබා ගත් සහතිකයක්, ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ලබාදිය යුතුය.

අවිවාහක සාමාජිකයින් :- සාමාජිකයා සහ වයස අවු. 70 ට අඩු ගුරුභවතාගේ දෙමව්පියන්

උප ලේඛනය 03 - පෞද්ගලික හදිසි අනතුරු රක්ෂණාවරණය.

1. පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණය

1.1 හදිසි අනතුරකින් මරණය දී පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණය යටතේ රු. 2,000,000.00 ලබා දේ.

1.2 හදිසි අනතුරක් හේතුවෙන් පමණක් සිදුවන ස්ථිර පූර්ණ අකර්මණ්‍යතාවයකදී හෝ ස්ථිර අර්ධ අකර්මණ්‍යතාවවකදී රු. 1,500,000.00 ලබාදේ. එය පහත පරිදී වේ.

ප්‍රතිලාභ උපලේඛනය

01.	ඇස් දෙකෙහිම පෙනීම ස්ථිර හා පූර්ණ වශයෙන් අහිමි වී යාම.	100%	හදිසි අනතුර සිදු වී මාස 03 ක් ඇතුළත සිදුවන
02.	කපා ඉවත් කිරීම හේතුවෙන් අත් දෙකම හෝ පාද දෙකම හෝ එක් අතක් හෝ එක් පාදයක් පූර්ණ වශයෙන් අහිමි වීම.	100%	
03.	කපා ඉවත් කිරීම හේතුවෙන් එක් අතක් හෝ එක් පාදයක් පූර්ණ වශයෙන් අහිමි වීම සමග එක් ඇසක පෙනීම ස්ථිර හා පූර්ණ වශයෙන් අහිමි වීම.	100%	
04.	එක් ඇසක පෙනීම ස්ථිර හා පූර්ණ වශයෙන් අහිමි වීම.	50%	
05.	කපා ඉවත් කිරීම හේතුවෙන් එක් අතක් හෝ එක් පාදයක් අහිමි වීම	50%	

පහත සඳහන් අවස්ථාවල දී වන්දි ගෙවීම සිදුකරනු නොලැබේ.

1. . එක් සිදුවීමක දී හදිසි අනතුරු හේතුවෙන් ඇතිවන ඉහත (01) සිට (05) දක්වා වන අනතුරේ ප්‍රතිඵල අවස්ථා අතරින් දායකයාට වඩාත් ඉහළ ප්‍රතිලාභ ලැබෙන එක් අවස්ථාවක් සඳහා පමණක් වන්දි ලබා දීම සිදු කරනු ලැබේ. එම අනතුරේ ප්‍රතිඵල අවස්ථා අතරින් කිහිපයකට දායකයා මුහුණ දී ඇති විටකදී ප්‍රතිලාභ ලබාදෙන ප්‍රතිඵල අවස්ථාවට හැර වෙනත් අනතුරේ ප්‍රතිඵලයකට හෝ පසු සිදුවීමකින් ඇතිවන ප්‍රතිඵලයකට නැවත වන්දි ගෙවීම සිදු කරනු නොලැබේ

2. ස්වාභාවික මරණ රක්ෂණාවරණය.

මෙම රක්ෂණාවරණය මගින් ස්වාභාවික හේතුවක් මුල්කොට සිදුවන මරණ සඳහා වන්දි ලබාදෙනු ලැබේ. (මෙම රක්ෂණාවරණය, රක්ෂණ ඔප්පුවේ දිනයේ සිට දින 90 කට පසු ක්‍රියාත්මක වේ.)

2.1 ස්වාභාවික මරණ ආවරණය - සාමාජිකයින් සඳහා පමණි - රු. 700,000.00

2. වෙනත් රෝගාබාධයක් හේතුවෙන් සිදුවන ස්ථිර පූර්ණ අකර්මණ්‍යතාවයක දී හෝ ස්ථිර අර්ධ අකර්මණ්‍යතාවයක දී - රු. 200,000.00 (ජීවිත කාලයටම එක් වරක් පමණි)